Australian Government
Department of Home Affairs

මෙම පිටුවෙහි


- තීරණාත්මක කුසලතා සහ ක්ෂේත්‍ර
    - තීරණාත්මක ක්ෂේත්‍රවල හෝ තීරණාත්මක කුසලතා ඇති අය සඳහා ගමන් කිරීම සම්බන්ධ බැහැර කිරීම් අවශ්‍යතා
    - ගමන් කිරීම සම්බන්ධ බැහැර කිරීමකට අයදුම් කිරීමට පෙර මා හට වීසා බලපත්‍රයක් තිබිය යුතුද?
    - ආසියා පැසිෆික් ආර්ථික සහයෝගීතා (APEC) ව්‍යාපාර ගමන් කාඩ්පතක් (ABTC) ඇතිව ගමන් කිරීම
    - බැහැර කිරීමකට මාර්ගගතව අයදුම් කරන්න
    - වැඩිදුර ප්‍රශ්න


# තීරණාත්මක කුසලතා සහ ක්ෂේත්‍ර

ඕස්ට්‍රේලියානු ප්‍රජාවගේ සෞඛ්‍යය ආරක්ෂා කිරීම සඳහා ඕස්ට්‍රේලියාව සතුව දැඩි දේශ සීමා ක්‍රියාමාර්ග ඇත. ඕස්ට්‍රේලියාවේ සිට සහ ඕස්ට්‍රේලියාව වෙත දැනට ඉතාම සීමිත ගුවන් ගමන් පමණක් ඇති අතර, මෙම අවස්ථාවේදී ඔබට ගමන් කිරීමට නොහැකි වීමට ඉඩ ඇත. ගමන් කිරීම සම්බන්ධ සීමා, වෙනස් කිරීම්වලට යටත්වේ. නිතිපතා පරීක්ෂාකර ගන්න. බලන්න: ජාතික කැබිනට් මණ්ඩල මාධ්‍ය ප්‍රකාශන.

ඕස්ට්‍රේලියානු පුරවැසියන් ඇතුළු, ඕස්ට්‍රේලියාව වෙත පැමිණෙන සියළුම මගීන්, තමා පැමිණෙන තොටුපළේ ඇති හෝටලයක් වැනි නියම කරන ලද පහසුකමක දින 14 ක් නිරෝධායනය විය යුතුය. ගමන් කරන අය සඳහාවූ කොරෝනා වයිරස් (කෝවිඩ්-19) උපදෙස් බලන්න. ඔබගේ නිරෝධායනය සඳහා යන වියදම ඔබ විසින් දැරීමට සිදුවිය හැකිය. නිරෝධායන අවශ්‍යතාවයන් සම්බන්ධ වැඩිදුර විස්තර සොයා ගැනීම සඳහා අදාල ප්‍රාන්ත සහ ටෙරිටරි රජයේ සෞඛ්‍යය දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධවන්න.

## තීරණාත්මක ක්ෂේත්‍රවල හෝ තීරණාත්මක කුසලතා ඇති අය සඳහා ගමන් කිරීම සම්බන්ධ බැහැර කිරීම් අවශ්‍යතා

පහත අවස්ථාවලදී ඕස්ට්‍රේලියානු දේශසීමා බලකායේ කොමසාරිස්වරයා විසින් ඔබ පුරවැසියෙකු නොවන්නේ නම් ඔබට තනිව ලබාදෙන බැහැර කිරීමක් ලබාදිය හැකිය:

- කෝවිඩ්-19 ප්‍රතිචාරය සම්බන්ධ අරමුණක් සඳහා උපකාර කිරීමට ඕස්ට්‍රේලියානු රජයේ හෝ ප්‍රාන්ත හෝ ටෙරිටරි රජයක ආරාධනාව මත ගමන් කරන අවස්ථාවක

- ගුවන් ගිලන් රථ, වෛද්‍යමය වශයෙන් ඉවත් කිරීම් සහ වෛද්‍ය සැපයුම් ලබාදීම ඇතුළු තීරණාත්මක හෝ විශේෂඥ වෛද්‍ය සේවා ලබාදීම
- අත්‍යවශ්‍ය භාණ්ඩ සහ සේවා සැපයුම පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය තීරණාත්මක කුසලතා (වෛද්‍ය තාක්ෂණය, තීරණාත්මක යටිතල පහසුකම්, විදුලි සංදේශ, ඉංජිනේරු සහ පතල් කැණීම්, සැපයුම් ජාල ප්‍රවර්ධන, වෘද්ධෝපගත රැකවරණ, කෘෂිකර්මාන්තය, ප්‍රාථමික කර්මාන්ත, ආහාර නිෂ්පාදනය, සහ සමුද්‍රීය කර්මාන්තය ආදිය)
- ඕස්ට්‍රේලියානු සේවකයන් නොමැති අවස්ථාවල, ඕස්ට්‍රේලියානු ආර්ථිකය යථා තත්වයට පත්කර ගැනීමට අවශ්‍ය තීරණාත්මක ක්ෂේත්‍රවල සේවා සැපයීම (මූල්‍ය තාක්ෂණය, මහා පරිමාණ නිෂ්පාදන, සිනමා, මාධ්‍ය සහ රූපවාහිණී නිෂ්පාදන සහ නැග එන තාක්ෂණය ආදිය)
- ආගමික හෝ දේවධර්ම ක්ෂේත්‍රවල තීරණාත්මක කුසලතා සැපයීම
- සංක්‍රමණ කුසලතා ප්‍රමුඛතා වෘත්තීය ලැයිස්තුවේ (Priority Migration Skilled Occupation List (PMSOL)) ඇති වෘත්තීයක ඕස්ට්‍රේලියාවේ සේවය කිරීම සඳහා ඔබගේ සේවායෝජකයා මගින් ඔබට අනුග්‍රාහකත්වය ලබාදීම.
- ඕස්ට්‍රේලියානු රජය හෝ ප්‍රාන්ත හෝ ටෙරිටරි රජයක් මගින් සහාය ලබාදෙන කිසියම් අයෙකුගේ පැමිණීම ඕස්ට්‍රේලියාවේ ජාතික සුභසිද්ධිය සඳහා වන අවස්ථාවල.

මෙම කාණ්ඩය යටතේ ඉල්ලීමක් පුද්ගලයෙකු විසින් හෝ ඔවුන් වෙනුවෙන් ව්‍යාපාරයක් මගින්ද ඉදිරිපත් කල හැකිය. එක කණ්ඩායමේ/ව්‍යාපාරයේ ගමන් කරන අය කිහිප දෙනෙකුගේ අයදුම්පත් එකට සම්බන්ධකල හැකි අතර ඒ මගින් එකී ඉල්ලීම් එකට සලකා බැලිය හැකිවේ.

පහත ඇති ෆෝරමය උපයෝගී කර ගනිමින් කරුණාකර බැහැර කිරීම සඳහා අයදුම් කරන්න. එසේම ඉල්ලීමට උපකාරවන සාක්ෂිද ඉදිරිපත් කරන්න. ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කර නැතිනම්, වැඩිදුර සලකා බැලීමකින් තොරව ඉල්ලීම අවසාන කරනු ඇත. සියළු ලියකියවිලි නිල වශයෙන් ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කල යුතුය.

**බැහැර කිරීමක් සඳහාවූ ඉල්ලීම ගමන් කිරීමට අවම වශයෙන් සති දෙකකට පෙර, සහ මාස තුනකට වැඩි නොවන කාලයක් ඇතුලත ඉදිරිපත් කල යුතුය. හදිසි ව්‍යාපාර ගමන් මෙම කාලසීමාව ඇතුලත සලකා බලනු ඇත.**

ඉල්ලීමට පහත දේ ඇතුලත් කල යුතුයඃ

- **ගමන් කරන අයගේ තොරතුරුඃ** නම, උපන් දිනය, වීසා වර්ගය සහ අංකය, ගමන් බලපත්‍ර අංකය, යෝජිත නේවාසික ලිපිනය, සහ ඕස්ට්‍රේලියාවේ දුරකථන අංකය
- **ගමන් කිරීමට හේතුවඃ** ඔබගේ ඉල්ලීම කොමසාරිස්වරයාගේ අභිමතය/බැහැර කිරීම සඳහා සලකා බැලිය යුත්තේ කුමන හේතුව නිසාද

- **සහාය ලබාදෙන ප්‍රකාශනයඃ** බැහැර කිරීම සඳහා තීරණාත්මක කුසලතා/ තීරණාත්මක ක්ෂේත්‍ර සම්බන්ධ නිර්ණායකයන්ගෙන් එකක් ඔබ සපුරාලන ආකාරය දක්වන්න
- **ලබාදෙන සාක්ෂිඃ** තීරණාත්මක භාණ්ඩ සහ සේවා සපයන ව්‍යාපාරයක නියුතු ව්‍යාපාරයකින් ලිපියක්, ඔබගේ ගමන මෙම අවස්ථාවේදී තීරණාත්මක වන්නේ ඇයිද යන්න උපදෙස් ලබාදෙන ඕස්ට්‍රේලියානු රජයේ හෝ ප්‍රාන්ත හෝ ටෙරිටරි රජයේ අධිකාරියකින් ගත් ලිපියක් ආදී සහාය ලබාදෙන සාක්ෂි ඇතුලත් කල යුතුය

ගමන් කිරීමට පෙර වලංගු වීසා බලපත්‍රයක් තිබිය යුතු අතර කොමසාරිස්වරයාගෙන් ලබාගත් බැහැර කිරීමක් තිබිය යුතුය.

## ගමන් කිරීම සම්බන්ධ බැහැර කිරීමකට අයදුම් කිරීමට පෙර මා හට වීසා බලපත්රයක් තිබිය යුතුද?

මෙම කාණ්ඩය යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කරන අයෙකු විසින් ඕස්ට්‍රේලියාවේ ඇති ගමන් සීමාවලින් බැහැර කිරීමක් සඳහා අයදුම් කරන අවස්ථාවේදී වලංගු වීසා බලපත්‍රයක් තිබීම අවශ්‍ය නොවේ. ගමන් සීමා බැහැර කිරීම අනුමතවුවහොත්, ගමන් කිරීම සඳහා වලංගු වීසා බලපත්‍රයක් තිබිය යුතුය. වීසා බලපත්‍රයක් ප්‍රදානය කිරීම සඳහා සියළු අවශ්‍යතා සපුරාලිය යුතුය. වීසා ආකාර සහ අවශ්‍යතා සම්බන්ධ තොරතුරු දෙපාර්තමේන්තු වෙබ් අඩවිය වෙතින් ලබාගත හැකිය.

## ආසියා පැසිෆික් ආර්ථික සහයෝගීතා (APEC) ව්‍යාපාර ගමන් කාඩ්පතක් (ABTC) ඇතිව ගමන් කිරීම

ABTC ඇති අය ඕස්ට්‍රේලියාවේ ඇති ගමන් සීමාවලින් ස්වයංක්‍රීයව බැහැර නොවේ. තීරණාත්මක ක්ෂේත්‍රයකට සම්බන්ධ ව්‍යාපාර කටයුතු සඳහා ඕස්ට්‍රේලියාවට පැමිණීමට අවශ්‍යනම්, බැහැර කිරීමක් සඳහා ඉල්ලා සිටිය යුතු අතර ඔබගේ ඉල්ලීමට සහාය ලබාදෙන සාක්ෂි ලබාදිය යුතුය.

ABTC මගින් ඔබට ඕස්ට්‍රේලියාවේ වැඩ කිරීමට ඉඩකඩ ලබා නොදේ. ඔබ ඕස්ට්‍රේලියාවේ වැඩ කිරීමට අදහස් කරයි නම්, වැඩ කිරීම සඳහා අවසර ඇති වලංගු වීසා බලපත්‍රයක් තිබිය යුතුය.

ඔබගේ ABTC භාවිතයෙන් ඕස්ට්‍රේලියාවට පැමිණීමට බලාපොරොත්තුවේ නම්, වැඩිදුර විස්තර සඳහා විදේශ අයදුම්කරුවන් සඳහා ආසියා පැසිෆික් ආර්ථික සහයෝගීතා (APEC) ව්‍යාපාර ගමන් කාඩ්පත (ABTC) බලන්න.

## බැහැර කිරීමකට මාර්ගගතව අයදුම් කරන්න

කරුණාකර එක් පුද්ගලයෙකු සඳහා එක් ඉල්ලීමක් පමණක් ඉදිරිපත් කරන්න. වැඩිපුර ඉල්ලීම් ඉදිරිපත් කිරීම ඉල්ලීම් ඇගයීම ප්‍රමාදයට හේතුවේ. ඔබට බැහැර කිරීමක් ප්‍රදානය කර නැතිනම්, ඔබට ඕස්ට්‍රේලියාවට පැමිණීමට ගුවන් යානයකට ගොඩවීමට අනුමැතිය ලබා නොදෙන බැවින්, ඔබගේ ගමන් සැලැස්ම අනුව ගමන් නොකළ යුතුය. ඔබට ගමන් කිරීම සම්බන්ධ බැහැර කිරීමක් ප්‍රදානය කර ඇතිනම්, එම බැහැර කිරීමට අදාල සාක්ෂි ගුවන් තොටුපළ වෙත රැගෙන ආ යුතුය.

මාර්ගගතව අයදුම් කරන්න

## වැඩිදුර ප්‍රශ්න

තීරණාත්මක කුසලතා සහ ක්ෂේත්‍ර, සහ ගමන් කිරීම සම්බන්ධ බැහැර කිරීම අදාල ක්‍රියාවලිය හෝ දැනට ඉදිරිපත්කර ඇති තීරණාත්මක ගමන් සඳහා ගමන් සම්බන්ධ බැහැර කිරීමක් අදාල වැඩිදුර ප්රශ්න ඇතිනම්, කරුණාකර මාර්ගගත විමසීමේ ආකෘතිය සම්පූර්ණ කරන්න.